දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

"இசுருபாயா"
பத்தரமுல்லை.

"Isurupaya"
Battaramulla


පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව,

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/01/03/13

දිනය / திகதி / Date } 2004.07.23

චක්‍රලේඛ අංක : 2004/25

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පෞද්ගලික හා අනුමත පාසල්වල ප්‍රධානීන් වෙත,

**පාසල් සිසුන් ප්‍රසිද්ධ උත්සවවලට සහභාගීකරවීම**

උක්ත කරුණට අදාළව නිකුත් කර ඇති අධ්‍යාපන ලේකම්ගේ 1995.09.12 දිනැති 1995/25 දරණ චකුලේඛය හා 1977.08.12 දිනැති 1977/133 දරණ චක්‍රලේඛය හා 1986.10.01 දිනැති 1986/12 දරණ චක්‍රලේඛයත් මින් අවලංගු කරන අතර මින් ඉදිරියට බලපවත්වනු ලබන්නේ මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් බව දන්වමි.

02. විවිධ ආයතන හා සංවිධානයන් විසින් මෙහෙයවනු ලබන විවිධ වැඩසටහන් සඳහා පාසල් සිසුන් යොදවා ගැනීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා පැමිණෙන බවට හා පාසල් සිසුන් අතරේ විනය ගැටලු මතුවන බවට විවිධ අංශයන්ගෙන් පැමිණිලි ලැබී ඇත.

03. එබැවින් බාහිර ආයතන හා පුද්ගලයන් විසින් සංවිධානය කරනු ලබන පාසලින් බැහැර විවිධාකාර උත්සව හා ප්‍රදර්ශන සඳහා පාසල් සිසුන් සහභාගී කරවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට අමාත්‍යාංශය අදහස් කර ඇත. ඒ අනුව ඉදිරියට එවන් උත්සව සඳහා පාසල් සිසුන් සහභාගී කරවීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

(අ) තමාගේ පාසලේ පවත්වන උත්සව - ක්‍රීඩා උත්සවය, ත්‍යාග ප්‍රදානෝත්සවය, විවිධ ප්‍රසංග යනාදිය

ත්‍යාග ප්‍රදානොත්සවයකදී පවත්වනු ලබන කථා ඉතාම සීමාවිය යුතු අතර පවත්වනු ලබන කථා තුනකට සීමාවීම වැදගත්වේ. (ත්‍යාග ප්‍රදානෝත්සව වලදී විදුහල්පති වාර්තාව, ප්‍රධාන අමුත්තාගේ කථාව හා ස්තුති කථාව ප්‍රධාන වේ)

(ආ) රේඛිය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සංවිධානය කරනු ලබන අධ්‍යාපන උත්සව

i. ජාතික/පළාත් ක්‍රීඩා උළෙල

ii. ජාතික මට්ටමේ/ පළාත් මට්ටමේ සංස්කෘතික උත්සව.
මෙම උත්සව සංස්කෘතික අමාත්‍යාංශය/අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් සංස්කෘතික අමාත්‍යාංශය/පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ඒවා විය යුතුයි.

iii. රේඛිය අධ්‍යාපන ලේකම්ගේ/ පළාත් අධ්‍යාපන ලේකම්ගේ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකගත්වය ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සංවිධානය කරනු ලබන නිදහස් දින උත්සව, සංස්කෘතික උත්සව

iv. අතිගරු ජනාධිපතිනිය /ගරු අගමැතිතුමා/පළාත් ආණ්ඩුකාරතුමා/පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහභාගි වන හෝ රෙඛිය අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ හෝ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා සංවිධානය කරනු ලබන නිදහස් දින උත්සව, සංස්කෘතික උත්සව යනාදිය

v. විදේශ රාජ්‍ය නායකයින් සහභාගී වන උත්සව අවස්ථාවලදී පමණක් ශිෂ්‍යාවන් සීමිත සිසු කණ්ඩායම් සහභාගී කරවීමට හැකිය.

04. එහෙත් ප්‍රදේශයේ විවිධ සංවිධානයන් විසින් මෙහෙයවනු ලබන ආයතනයන් හා සංගම් විසින් පාසල් ශිෂ්‍යයන් යොදාගෙන කරනු ලබන නේවාසික හෝ නේවාසික නොවන වැඩසටහන් වලට ද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගී කරවීම නොකළ යුතුය. මෙයට අතිරේකව විවිධාකාර පුද්ගලයින් පිළිගැනීම සඳහා ශිෂ්‍යයින් මග දෙපස රැස්කර තැබීමත් අරමුදල් රැස්කිරීම හෝ වෙනත් ප්‍රචාරක කාර්යයන් සඳහාත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගි කරවා ගැනීම නොකළ යුතු වේ.

05. තව ද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගි කරවනු ලබන පාසල් ක්‍රීඩා උත්සව හැර අනෙකුත් උත්සව වල කාලය උපරිම වශයෙන් පැය දෙකක් (2) ක් විය යුතුය. එයට වඩා වැඩි කාලයක් ගනු ලබන උත්සව සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගි කරවා ගැනීමට කටයුතු නොකළ යුතුවේ. යම් රාජ්‍ය ආයතනයක් හෝ වෙනත් සංවිධානයක් විසින් ශිෂ්‍යයින් උත්සව සඳහා සහභාගි කරවා ගැනීමට කටයුතු කරන විට දී ඔවුන් සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රවාහන, ආහාර. සෞඛ්‍ය හා ආරක්ෂාව ඇතුළු සියලු පහසුකම් සැපයීමට සංවිධායකයින් විසින් කටයුතු කළ යුතු වේ.

06. මෙයට අතිරේකව පාසල් තූර්යවාදක කණ්ඩායම් සහභාගී කරවීමද පහත සඳහන් අවස්ථාවලට පමණක් සීමාවිය යුතුය. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1999/25 චක්‍රලේඛයෙන් තවදුරටත් බලපැවැත්වෙන බව අවධාරණය කරමි.

1 තමාගේ පාසලේ පවත්වන උත්සව

2 රේඛිය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සංවිධානය කරනු ලබන අධ්‍යාපන උත්සව

i. ජාතික/පළාත් ක්‍රීඩා උළෙල

ii. ජාතික මට්ටමේ/ පළාත් මට්ටමේ සංස්කෘතික උත්සව.ආගමික උත්සව

මෙම උත්සව සංස්කෘතික දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය සංවිධානය කරන ඒවා විය යුතුයි.

iii. රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ/ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ එකඟත්වය ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සංවිධානය කරනු ලබන නිදහස් උත්සව, සංස්කෘතික උත්සව යනාදිය

iv. අතිගරු ජනාධිපතිනිය හෝ ගරු අගමැතිතුමා හෝ පළාත් ආණ්ඩුකාරතුමා හෝ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහභාගී වන හෝ රේඛීය අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ හෝ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා සංවිධානය කරනු ලබන නිදහස් දින උත්සව ආගමික සංස්කෘතික උත්සව යනාදිය

v. විදේශ රාජ්‍ය නායකයින් සහභාගී වන උත්සව

07. මෙයින් පරිබාහිරව කුමන හෝ අවස්ථාවන් සඳහාවත් පාසල් තූර්යවාදක කණ්ඩායම් සහභාගී කරවීමට කටයුතු නොකළ යුතු බව අවධාරණය කරමි.

08. මෙම කරුණුවලට අමතරව පාසල් තුළ පැවැත්වෙන උද්‍යාසන රැස්වීම සම්බන්ධයෙන් ද ඔබගේ අවධානය යොමු කරවමි.

09. සෑම විදුහලකම දිනපතා එදිනට නියමිත වැඩ ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ගුරු මණ්ඩලය හා ශිෂ්‍යයින්ගේ සහභාගීත්වයෙන් ආගමික වතාවත් පවත්වා රැස්වීම පැවැත්විය යුතුය. රැස්වීම පැවැත්විය හැකි ස්ථානය සීමිත නම් ඉඩකඩ ඇති ආකාරයට අංශ මට්ටමින් උද්‍යාසන රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කළ හැක. එහිදී ආගමික වතාවත්වලින් අනතුරුව සතියේ මුල් දින ජාතික කොඩිය සහ පාසල් කොඩිය ඔසවා ජාතික ගීයේ මුල් පද තුන ගායනය කර අනතුරුව විදුහල් ගීතය ගායනය කළයුතු අතරම විදුහල්පති විසින් හෝ ආචාර්ය මණ්ඩලයේ කෙනෙකු විසින් උපදේශාත්මක දේශනයක් පැවැත්විය යුතු වේ. මේ කාර්ය සඳහා විනාඩි 15 ක පමණ කාලයක් වෙන් කළ යුතු ය. මෙම වැඩපිළිවෙළ අප්‍රමාදව ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක් වේ නම් විදුහලේ පවතින පහසුකම් ගැන සලකා උද්‍යාසන රැස්වීම සංවිධානය කිරීම විදුහල්පති සතු වගකීමකි. මේ ආකාරයට ජාතික හා පාසල් කොඩි එසවීම සතියේ සඳුදා දින පමණක් කළ හැක.

10. අඟහරුවාදා, බ්‍රහස්පතින්දා 'හා සිකුරාදා යන තෙදින තුලදී විදුහලේ සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විනාඩි 10 කට නොවැඩි කාලයක් තුල ශාරීරික සුවතා අභ්‍යාස මාලාවක් පැවැත්වීමට කටයුතු කළයුතු වේ. මේ සඳහා ක්‍රීඩා ගුරු භවතා ද ක්‍රීඩා ගුරු භවතෙකු නොමැති විට මේ සම්බන්ධව දැනුම සහිත ගුරුවරයෙකු යොදාගත හැක.

11. උද්‍යාසන රැස්වීම හා ශරීර සුවතා අභ්‍යාස සඳහා වෙන්කළ යුතු උපරිම කාලය විනාඩි 15 කට නොවැඩි විය යුතුය.

12. දවස අවසානයේදී සිසුන් පංති කාමරවලින් පිටවීමේදී පංතියේ අවසාන කාල පරිච්ඡේදය ඉගැන්වීමේ නිරතව සිටි ගුරු ගවතුන් විසින් තම පංති කාමරයේ සිසුන් ආගම සිහිකර විනීත ආකාරයෙන් පංති කාමරයෙන් පිටවීම පිළිබඳව අවධානයෙන් යුතුව කටයුතු කළ යුතුය.

13. මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් ඒ සඳහා පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ විමසීම මැනවි.

වෛද්‍ය තාරා ද මෙල්,
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය